# බුදුදහම ජාත්‍යන්තරයට ගෙනයාම සඳහා අනගාරික ධර්මපාලතුමාගෙන් ලැබුණු දායකත්වය

**ජී.එම්.යූ. ප්‍රේමරත්න[1], ජී.අයි.එස්. පෙරේරා[2],**

**ජේ.ඒ.අයි.කේ. ජයතිලක[3] , කේ.බී.ටී.යූ. මධුශංඛ[4]**

*[1, 2]ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

*[3]පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

*[4]පර්යේෂණ මධ්‍යස්ථානය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

*[1*]manjuhis88@gmail.com, [2*]suranjiperera89@gmail.com,*

*[3*]induniljayathilaka@yahoo.com, [4*]thilinimadushankaa@gmail.com*

බෞද්ධ බලවේගය ඉදිරියට ගෙනයාමට උරදුන් පතාක යෝධයන් අතර අනගාරික ධර්මපාලතුමාට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. මෙම අධ්‍යයනයේදී විමර්ශනයට භාජනය කෙරෙන්නේ බුදුදහම ජාත්‍යන්තරයට ගෙනයාම සඳහා අනගාරික ධර්මපාලතුමාගෙන් ලැබුණු දායකත්වය පිළිබඳවයි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ මෙතුමා බුදුදහම ජාත්‍යන්තරයට ගෙනයාම සඳහා ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න විමර්ශනය කිරීමයි. සෙසු අරමුණු වූයේ මෙම කටයුත්තේදී ධර්මපාලතුමා මුල් කරගත් රටවල් මොනවාද, එකී රටවල් තුළ ඇතිවූ බෞද්ධාගමික පුනර්ජීවනය කුමන ස්වරූපයක් ගත්තේ ද යන්න විමසීමයි. පර්යේෂණ ක්‍රමවේදය වූයේ මූලාශ්‍රය අධ්‍යයනයයි. එහිදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කෙරිණි. අනගාරික ධර්මපාලතුමා ශ්‍රී ලාංකේය බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමෙන් නොනැවතී මහාබෝධි සංගමය මගින් එය ජාත්‍යන්තරය දක්වා ද ගෙන යාමට කටයුතු කළේ ය. මෙම අධ්‍යයනයේදී ඉන්දියාව, ජපානය, චීනය, එංගලන්තය, ජපානය සම්බන්ධයෙන් එතුමා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කෙරිණි. ඒ අනුව එතුමාගේ උත්සහය සාර්ථක වූ අතර එය පසුකාලීන බෞද්ධාගමික පුනර්ජීවනයට උරදුන් පුරෝගාමීන්ට ද ආදර්ශයක් සැපයූ බව නිගමනය කළ හැකි ය.

මුඛ්‍ය පද ඃ අනගාරික ධර්මපාල, බෞද්ධ පුනර්ජීවනය, බෞද්ධ ධර්ම ප්‍රචාරය, මහාබෝධි සංගමය, ප්‍රචාරණ උපායමාර්ග